# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපායස , බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No } 10120

ෆැක්ස්
தொலைநகல
Fax } 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone } 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site } www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail } dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO } 916/2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No } / 2024

දිනය
திகதி
Date } 31/05/2024
පැය 1305

## මාධ්‍ය නිවේදනය

**<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු</u>**

**01. 2024.05.30 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 01 | 01 | 45 | 360 | තඹ දඟර 01<br>යකඩ බැරල් 01<br>ගෑස් ලිප 01 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

**02. තීරු බදු රහිතව නීති විරෝධී ලෙස මෙරටට ගෙන්වන ලද දුම් වැටි සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකය.**

2024.05.30 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ජා ඇල පොලිස් වසමේ වැටලීමක් සිදු කර නීති විරෝධී දුම්වැටි 2400ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ජා ඇල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 27 ක් වූ ජා ඇල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** ජා ඇල පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03.** **අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කල්මුණේ කඳවුර.**

2024.05.30 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කල්මුණේ කඳවුර නිලධාරීන් කණ්ඩායමක් විසින් සයින්දමරුදු පොලිස් වසමේ අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලි ග්‍රෑම් 200 ක් වැටලීමක් සිදු කර සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන සයින්දමරුදු පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 59 ක් වූ කල්මුණ 03 ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** සයින්දමරුදු පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04.** **ගංජා පැළ සමඟ සැකකරුවන් දෙදෙනකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා උඩවලව කඳවුර.**

2024.05.30 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා උඩවලව කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් සෙවනගල පොලිස් වසමේ වැටලීමක් සිදු කර ගංජා හේනක් වටලා ගංජා පැළ 5005ක් සමඟ සැකකරුවන් දෙදෙනකු අත්අඩංගුවට ගෙන සෙවනගල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 47 හා 57 ක් වූ සෙවනගල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.** සෙවනගල පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**05.** **හෙරොයින් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කුරුණෑගල කඳවුර**

2024.05.30 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කුරුණෑගල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ජා ඇල පොලිස් වසමේ වැලිගම්පිටිය ප්‍රදේශයේදී වැටලීමක් සිදු හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලි ග්‍රෑම් 400ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ජා ඇල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 ක් වූ කඳාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** ජා ඇල පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**